إدارة أوقاف صالح عبدالعزيز الراجحي

# ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්ති

සංස්කාරක

අෂ් ෂෙයික් මුහම්මද් ඉබ්න් සුලෛමාන් අල් තමීමි

ඉංග්‍රීසි පරිවර්තනය

ආචාර්ය: ඩී.එම්.ගාලි

ආචාර්ය: ඩී.ඒ.ජලාල්

සිංහල පරිවර්තනය

එම්.අයි.ඩී.ලතීෆ්

# الأصول الثلاثة

# ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්ති


محمد بن سليمان التميمي

සංස්කාරක

**අෂ් ෂෙයික් මුහම්මද් ඉබ්න් සුලෛමාන් අල් තමීමි**

ඉංග්‍රීසි පරිවර්තනය

**ආචාර්ය ඩී.එම්.ගාලි**

**ආචාර්ය ඩී.ඒ.ජලාල්**

සිංහල පරිවර්තනය

**එම්.අයි.ඩී.ලතීෆ්**



م . ب . د

بسم الله الرحمن الرحيم

# මුල් ප්‍රකාශනය

සෞදි අරාබියාවේ අධ්‍යාපනික පර්යේශන, ෆත්වා, දඃවා සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය යටතේ අෂ් ෂෙයික් මුහම්මද් ඉබ්න් සුලෙමාන් අල් තමීමි විසින් ප්‍රකාශයට පත්කොට බෙදා හරින ලදී .

## මහා කාරුණික පරම දයාබර අල්ලාහ්ගේ නාමයෙන්
*(ආරම්භ කරමි)*

අපි පහත සඳහන් කරුණු හතර අවබෝධකර ගත යුතු බව ඔබ (ඔබට අල්ලාහ්ගේ දයාව හිමිවේවා!) දැනගත යුතුය.

1. දැනුම අල් කුර්ආනය සහ අල් හදීස් ආශ්‍රිතව අල්ලාහ් හැඳින ගැනීම, ඔහුගේ දූතයාණන් වූ මුහම්මද් නබි *සල්ලල්ලාහු* අලෛහිවසල්ලම් හැඳින ගැනීම සහ අල්ලාහ්ගේ ආගම වූ ඉස්ලාමය හැඳින ගැනීම මෙයට ඇතුලත්වේ.

2. මෙම දැනුම අනුව කටයුතු කිරීම.

3. මෙම දැනුම ප්‍රචලිත කිරීම.

4. මෙම දැනුම ප්‍රචලිත කිරීමේදී අනිවාර්යයෙන් මතුවන දුක් ගැහැට හා මර්දනයන් හමුවේ නොසැලී ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කිරීම

## අල් කුර්ආනයෙන් සාධක:-

*"කාලයෙන් (ප්‍රමාණකොට) ඇත්තෙන්ම මිනිසා හානියට මුහුණ දෙන්නේය. විශ්වාස කොට යහකමුත් කොට එකිනෙකාට සත්‍යයෙන් උපදෙස් දී ඉවසීමෙනුත් අවලුර ක්‍රියා කරන්නවුන් හැර ය.*

සූරාව : අල් අස්ර් - 103 : 1 - 3

මෙම සූරාව පිළිබදව අෂ්ෂාෆි: මෙසේ කරුණු කියා සිටී.

"වෙනත් තර්කයන් නොමැතිව මෙම සූරාව පමණක් අල්ලාහ් සිය දාසයන් වෙත පහළ කළේ නම් එය පමණක් ඔවුන්ට ප්‍රමාණවත් වන්නේය."

අල් කුර්ආනයෙහි මෙසේද සදහන්වේ:-

*"අල්ලාහ් හැර අන් දෙවියෙක් නැතැයි දැන ගනිවු. තවද ඔබේ පාපයන්ට සමාව ඉල්ලා සිටිවු"*

සූරාව : මුහම්මද් - 47 : 19

මේ අනුව පළමුවෙන්ම දැනුම ඇතිවිය යුතුය. ඊළඟට වචන හා ක්‍රියාවන් මගින් එයට ජීවය ලබාදිය යුතුය. සෑම මුස්ලිම් පුරුෂයෙක්ම සහ ස්ත්‍රියක්ම මෙකී මූලධර්මයන් තුන අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව ඔබ දැන සිටිය යුතුය.

<u>පළමුවැන්න:-</u>

අල්ලාහ් අප මවා අපට පෝෂණය සපයන්නේය. එමෙන්ම අපට මාර්ගෝපදේශකත්වයද සලසා ඇත. ඔහු අප වෙත ඔහුගේ දූතයාණන් වූ මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* එවා ඇත්තාහ. මේ අනුව යමෙක් ඔහුට අකීකරු වන්නේද හෙතෙම නිරයට වැටෙන්නේය.

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි:-</u>

> *"ඇත්තෙන්ම, අප ෆිර්අවුන් වෙත රසූලවරයෙකු එව්වාක්මෙන්, ඔබ ගැන සාක්ෂි දැරීම පිණිස, අපි ඔබ වෙතද රසූලවරයෙකු එව්වෙමු. එහෙත් ෆිර්අවුන් රසූලවරයාට අකීකරු විය. එසේ හෙයින් අපි බිහිසුනු දඬුවමකට ඔහු යටත් කළෙමු."*

සූරා : අල් මුZසම්මිල් - 73 : 15 - 16

ෙදවැන්න:-

අභිමානවත්වූ මලාඉකාවරයෙකු හෝ වේවා, ශුද්ධ පනිවුඩයක් ගෙනා අනාගත වක්තෘවරයෙකු හෝ වේවා තමන් හා සමානයෙක් බවට පත් කිරීම අල්ලාහ් කිසිසේත් අනුමත නොකරයි.

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"නැමදුම් පොලවල් අල්ලාහ්ට (පමණක්) මය. එසේ හෙයින් අල්ලාහ් සමඟ අන් කිසිවකුට ආරාධනා නොකරවු."*

සූරාව : ජින් - 72 : 18

තෙවැන්න:-

මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* තුමාට කීකරුව අල්ලාහ්ගේ ඒකත්වය පිලිගන්නා කිසිවෙක් තමන්ගේ කිට්ටු ඥාතිවරයෙකු වුවද අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා ප්‍රතිෙක්ෂප කරනු ලබන අයෙකු ප්‍රිය නොකළ යුතු ය.

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"අල්ලාහ්ටද ඔහුගේ රසූල්වරයාටද විරුද්ධ වන කෙනෙකු ඔබගේ පියා වුවද, පුතෙකු වුවද, සොහොයුරෙකු වුවද, ඥාතියෙකු වුවද, එවන් අයෙකු ප්‍රිය කරන්නෙකු අල්ලාහ් ගැනද අන්තිම දිනය ගැනද විශ්වාස කරන ජනතාව අතුරෙහි ඔබ නොදකින්නෙහිමය. මේ අයගේ සිත්හි ඔහු අචල විශ්වාසය තහවුරුකොට ඔහුගේ ශුද්ධාත්මයෙන් එය සවිමත් කොට ඇත්තේය. තවද යටින් ගලා බසින ගංගාවන්ගෙන් යුත් "ජන්නාවන්ට" ඔහු ඔවුන්ට ඇතුළු කරවන්නේය. ඔවුහු එහි සදා කල් වෙසෙත්. අල්ලාහ් ඔවුන් කෙරෙහිද ඔවුන් අල්ලාහ් කෙරෙහිද ප්‍රසාදයට පත්වී සිටිති. මේ අයය අල්ලාහ්ගේ පක්ෂය. ඇත්තෙන්ම, අල්ලාහ්ගේ පක්ෂයමය ජයග්‍රාහකයෝ."*

සූරාව : අල් මුජාදිලා - 58 : 22

ඒකදේවවාදය (අල් හනීෆා නැත්නම් ඉබ්‍රාහීම්ගේ වර්ගයා) අනුව පිවිතුරු භක්තියෙන් යුතුව අල්ලාහ් පමණක් නැමදිය යුතු බව ඔබ දැන ගත යුතුය. (අල්ලාහ්ට කීකරුවීම සඳහා ඔබට නිසි මග පෙන්වීම ලැබේවා!) මුළු මහත් මිනිස් වර්ගයා වෙතම අල්ලාහ් පනවා ඇති ආඥාව මෙයයි. ඇත්ත වශයෙන්ම ඔහු මිනිස් වර්ගයා මවා ඇත්තේ මේ සඳහාය.

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"මම ජින්වරුන්ද, මනුෂ්‍යයන්ද මා නැමදුම් කරන්නට මිස නොමැව්වෙමි"*

සූරාව : අල් දාරියාත් - 51 : 56

මා නැමදුම් කිරිම යනුවෙන් අදහස් කරනුයේ මගේ ඒකාග්‍රතාවය පිළිබඳව සාක්ෂි දැරීමයි. ඒකදේවවාදය අල්ලාහ්ගේ ප්‍රධාන ආඥාවයි. එයින් අදහස් කරනුයේ නැමදුම් කළයුතු දෙවියන් ඔහු පමණක් බවයි. ඔහු සමඟ සමානයන් තබන්නාවූ බහුදේවවාදය තරමයේ තහනම් කරනු ලැබ ඇත.

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"අල්ලාහ් නමදිවු. ඔහුට කිසිවකින් සමානයක් නොතබවු"*

සූරාව : අන්නිසා - 4 : 36

## <u>මූලධර්මයන් තුන</u>

සෑම මුස්ලිම් වරයෙක් විසින්ම අවබෝධ කරගත යුතු මූලධර්මයන් තුන කවරේදැයි ඔබෙන් ප්‍රශ්න කළහොත් එයට ඔබ දිය යුතු පිළිතුර නම්:-

> "සෑම නැමදුම් කරුවෙක්ම සිය ස්වාමිහු, ඔහුගේ ආගම සහ ඔහුගේ දූතයාණන්වූ මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහි වසල්ලම්* තුමා දැන සිටිය යුතුය" යන්න වේ.

## <u>පළමුවන මූලධර්මය</u>

### <u>අල්ලාහ් පිළිබඳ දැනුම</u>

ඔබේ ස්වාමිහු කවරෙක් දැයි ඔබෙන් අසනු ලැබුවහොත් එයට දෙන පිළිතුර නම්:-

> "මගේ ස්වාමිහු අල්ලාහ්ය. ඔහුගේ ආශිර්වාදයෙන් මා සහ ඔහුගේ සෙසු මැවිලි පෝෂණය කරනු ලබන්නේ ඔහුය. ඔහු මගේ දෙවියන් වහන්සේය. ඔහු හැර අන් දෙවි කෙනෙක් නැත."

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"පැසසුම් සියල්ල සකල ලෝක සංවර්ධන සංරක්ෂණ පරිපෝෂණ පරිපාලන කරන්නා වූ අල්ලාහ්ටය."*

සූරාව : අල් ෆාතිහා(ආරම්භක සූරාව) - 1 : 1

අල්ලාහ් හැර අන් සෑම දෙයක්ම ඔහුගේ මැවීම්ය. මම ඔහුගේ මැවීම්වලින් කොටසක් වෙමි. ඔබ ස්වාමීහු ගැන, මෙම දැනුම ඔබ ලබාගත්තේ කෙසේදැයි ඔබෙන් අසනු ලැබුවහොත් "ඔහුගේ සලකුණු සහ ඔහුගේ මැවිලි ඇසුරෙන්"යයි පිළිතුරු දෙන්න. රාත්‍රිය සහ දහවල, හිරු සහ හඳ, ආකාශය සහ පොළොව සහ එහි සහ ඒවාට ඔබ්බෙන් පිවත්වන සියල්ලක්ම ඔහුගේ සලකුණු සහ මැවිලි අතරේ වෙත්.

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"රැයද, දහවලද, හිරුද, සඳද ඔහුගේ සලකුණුවේ. හිරුටද සඳටද නමස්කාර නොකරවූ. තොපි ඔහුට නමදින්නහු නම් ඒවා මවනු ලැබූ අල්ලාහ්ට නැමදුම් කරයි."*

සූරාව : හාමීම් අස්සජ්දා - 41 : 37

*"ඔබගේ ස්වාමි දින හයක දී අහස්ද, පොළොවද මවන ලද අල්ලාහ්මය. ඉන්පසු ඔහු රාජාසනයෙහි වැඩ සිටියේය. ඔහු එකක් අනෙක ලුහුබ දින්නාසේ දහවල රාත්‍රියෙන් ආවරණය කරන්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාද ඔහු විසින් මවන ලදුව ඔහුගේ සැලැස්ම අනුව ක්‍රියා කරන්නේය. මැවීමද, පාලනයද ඔහු සතුය. ලොව මවා ආරක්ෂා කර පෝෂණ කරන්නාවූ අල්ලාහ්ට සියළු ප්‍රශංසා හිමිවේවා."*

සූරාව : අල් අ:රාෆ් - 7 : 54

**නැමදුම් කළයුත්තේ අල්ලාහ්ට පමණි.**

**<u>අල් කුර්ආනයෙන් සාක්ෂි:-</u>**

*"එම්බල මනුෂ්‍යයිනි ! ඔබ ආරක්ෂා වනු පිණිස ඔබද ඔබට පෙර සිටියවුන්ද උත්පාදනය කළ ඔබගේ ස්වාමිහු නමදිවු. ඔබට පොළොව පලසක් මෙන්ද අහස වියනක් මෙන්ද නිර්මාණය කළේ ඔහුය. ඔහු අහසින් වැසි දිය වට වන්නේය. ඒ කරණකොට ඔබට ආහාර වශයෙන් පළතුරු වගී හටගන්නේය. එහෙයින් සත්‍යය දැන සිටින්නා වූ ඔබ අල්ලාහ්ට සමානයන් නොතබවී*

සූරාව : අල් බකරා - 2 : 21 - 22

ඉබ්න් කතීර් පවසන අන්දමට "නැමදුම් හිමිවිය යුත්තේ මේ සියල්ලක්ම මැවුම් කරුවානන්ට පමණි." අල්ලාහ් විසින් පනවා ඇති නැමදුම් විධිවලින් සමහරක් නම් :-

අල්ලාහ්ට යටහත් පහත්වීම *"අල් ඉස්ලාම්"*, *විශ්වාසය* (අල්ලාහ්ගේප්‍රතිපත්තීන්) *"අල් ඊමාන්"*, *පුණ්‍ය දිමනා* *"අල් ඉහ්සාන්"*, *අයැදීම* *"අද් දුආ:"*, බිය බැති බව *"අල් kහවිෆ්"* අපේක්ෂා *"අර් රජා:"*, *විශ්වාසය (අල්ලාහ් ගැන)* *"අල් තවක්කල්"*, *අධිෂ්ඨානය* *"අර් රGබාහ්"*, *ගෞරව සම්ප්‍රයුක්ත බිය* *"අර් රහ්බාහ්"*, *ගෞරවය ප්‍රකාශකිරීම* *"අල් kහුෂූ:"*, *අවදානමක්* හෝ ආපදාවක් පිළිබඳ බිය *"අල් kහෂ්යත්"*, *පශ්චාත්තාපය* *"අල් ඉනාබාහ්"*, *යැදීම* *"අල් ඉස්තිආනාහ්"*, *පිළිසරණ සෙවීම* *"අල් ඉස්තිආZසා"*, *පිහිට පැතීම* *"අල් ඉස්තිGහාසාහ්"*, *කැප කිරීම* *"අල් Zබ්හ්" සහ භාරහාර "නZර්"*

මේවා ඇතුළු අල්ලාහ් විසින් නියම කරනු ලැබ ඇති නැමදුම් විධිවලින් අල්ලාහ් ඔහුගේ නම් වලින් උත්කර්ෂවත් කිරීම සිදුවේ.

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"නැමදුම් පොළවල් අල්ලාහ්ට (පමණක්) මය. එසේ හෙයින් අල්ලාහ් සමඟ අන් කිසිවෙකු අඬ නොගසවු."*

සූරාව : අල් ජින් - 72 :18

**මේ අනුව යමෙක් අල්ලාහ් උදෙසාම මිස මෙකී වතාවත් වලින් එකක් හෝ ඉටු කළ හොත් ඔහු බහු දේවවාදියෙකු සහ විශ්වාස නොකරන්නෙකු බවට පත්වේ.**

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"යමෙක් අල්ලාහ් සමඟ තමන්ට කිසිදු අවසරයක් නොමැති අන් දෙවිදේවතාවකුම ආරාධනා කරයිද හෙතෙම ඒ පිළිබඳව අල්ලාහ්ට වගකිව යුත්තෙකුවේ. ඇත්තෙන්ම විශ්වාස නොකරන්නෝ ජය අහිමි කරගන්නෝය"*

සූරාව : අල් මු:මිනූන් - 23 :117

## අයැදීම

හදීසයෙන් සාක්ෂි:-

"අයැදීම නැමදුමේ පිටගුණයයි"

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"මගෙන් අයැද සිටිනු. ඔබේ පැතුම මම ඉටු කරමි. මා නොනමදින උඩඟු අය ඇත්ත වශයෙන්ම පිළිකුලි සහගතව නිරයට ඇතුළු වන්නෝය" යි තොප හිමියෝ කීහ.*

සූරාව : අල් මු:මින් (ඝාෆිර්) - 40 : 60

## බිය

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"ෂෙයිතාන්මය ඔහුගේ සහචරයන් ගැන බිය ඇති කරන්නේ. ඔබ විශ්වාස කරන්නනු නම් මට බිය වනු."*

සූරාව :අල් ඉම්රාන් - 3 :175

## විශ්වාසය

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"කෙනෙකුට සිතාගත නොහැකි අයුරින් අල්ලාහ් ඔහුගේ අවශ්‍යතාවයන් සපුරාලන්නේය. යමෙක් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබන්නේද ඔහුට අල්ලාහ් පමණක් ප්‍රමාණවත්වේ. ඇත්ත වශයෙන්ම අල්ලාහ් ඔහුගේ අරමුණු සාක්ෂාත් කරන්නේය. අල්ලාහ් සෑම දෙයකටම නිසි අනුපාතයක් සලසා ඇත්තේය."*

සූරාව : අත් තලාක් - 65 : 3

## අධිෂ්ඨානය, ගෞරව සම්ප්‍රයුක්ත බිය සහ ගෞරවය ප්‍රකාශ කිරීම

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"අපි ඔහුගේ ප්‍රාර්ථනය ඉටු කළෙමු. ඔහුට "යහ්යා" බිහිකර දුනිමු. ඔහුගේ බිරිඳගේ වඳ බව නැති කළෙමු. යහකම් සඳහා එකපිට එක බැගින් යහ ප්‍රතිඵල ප්‍රදානය කළෙමු. ඔවුහු ආදරය, ගෞරවය සහ බියබැතිමෙන් යුතුව අපගෙන් ආයාචනා කළහ"*

සූරාව : අල් අන්බියා - 21 : 90

## අවදානමක් හෝ ආපදාවක් පිළිබඳ බිය

### අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"ඔවුන්ට (විශ්වාස නොකරන්නවුන්ට) බිය නොවනු. මට බිය වනු. මගේ අනුග්‍රහය ඔබට දක්වමි. ඔබද නිසි මග පෙන්වීමට අවනත වනු"*

සූරාව : අල් බකරා - 2 : 150

## පශ්චාත්තාපය

### අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"ඔබට දඬුවම් පැනවීමට පෙර ඔබ හිමියෙකට පශ්චාත්තාපයෙන් යුක්තව හැරෙවු. ඔහුට අවනතද වනු. අතපසු කළහොත් ඔබට උදව් කරනු නොලබන්නහුය"*

සූරාව : අZස් Zුමර් - 39 :54

## යැදීම

**අල් කුර්ආනයෙන් සාක්ෂි:-**

*"අපි ඔබම නමදිමු. ඔබෙන් පමණක් උදව් ඉල්ලමු."*

සූරාව : අල් ෆාතිහා(ආරම්භක සූරාව) - 1 : 5

**හදීසයෙන් සාක්ෂි:-**

"ඔබට උදව් අවශ්‍ය නම්, උදව් ඉල්ලා අල්ලාහ්ට ආයාචනා කරනු"

## පිළිසරණ සෙවීම

**අල් කුර්ආනයෙන් සාක්ෂි:-**

*"මම මිනිස් වර්ගයාගේ රාජෝත්තමයාණන් (පාලකයා) වූ සකල ලෝක ස්වාමීහුගේ පිළිසරණ පතමි" යි කියව.*

සූරාව : අන්නාස් - 114 : 1 - 2

## පිහිට පැතීම

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"ඔබ ඔබගේ ස්වාමියාගෙන් උදව් ඉල්ලූ කල්හි මලායිකාවරුන් දහසකින් මම ඔබට උදව් කරන්නෙමි" යි ඔහු ඔබට පිළිතුරු දුන් වග සිහි කරව"*

සූරාව : අන්ෆාල් - 8 : 9

## කැපවීම

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"ඇත්තෙන්ම මගේ සලාතද කැපවීමෙන් යුත් මගේ මෙහෙවරද මගේ ජීවිතයද මගේ මරණයද සියල්ලක්ම මවා පෝෂණය කරන්නාවූ අල්ලාහ්ටය" යි කියව"*

සූරාව : අන්ආම් -6 : 162

හදීසයෙන් සාක්ෂි:-

"වෙනත් දෙවි දේවතාවුන් වෙනුවෙන් කැප කරන්නන් අල්ලාහ්ගේ උදහසට පාත්‍රවේ"

භාර භාර

අල් කුර්ආනයෙන් සාක්ෂි:-

*"ඔවුහු ඔවුන්ගේ භාර ඉටු කරති. දුෂ්ටකම් පතුරුවන ලබන දින ගැන ඔවුන් බිය වෙති*

සූරාව : අල් දහ්ර් - 76 : 7

## දෙවන මූලධර්මය

## සාක්ෂි පදනම් කරගත් ඉස්ලාම් පිළිබඳ දැනුම

මෙම දැනුම එකම දෙවියන්වහන්සේ වශයෙන් අල්ලාහ්ට යටත් වීම, උන්වහන්සේගේ අණසකට කීකරුවීම සහ බහු දෙවිදේවතාවන් සහ බහු දේවවාදීන් ප්‍රතික්ෂේප කිරීම යන ගුණාංගයන්ගෙන සමන්විත වේ.

මෙම දැනුම ස්ථරයන් තුනකින් සමන්විත වේ :-

(අ) ඉස්ලාම් (යටහත් පහත්වීම)

(ආ) ඊමාන් (විශ්වාසය)

(ඇ) ඉහ්සාන් (පුණ්‍යඃ දීමනා)

මෙකී සෑම ස්ථරයක්ම තවත් කුළුණු මත පිහිටා ඇත.

## 1 වන ස්ථරය

## ඉස්ලාම් (යටහත් පහත්වීම)

එයට කුළුණු පහක් ඇත :-

1. අල්ලාහ් හැර නැමදීමට සුදුසු අන් දෙවි කෙනෙක් නැත. මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* තුමාණෝ අල්ලාහ්තආලාගේ දූතයා වන්නෝය යයි සාක්ෂි දැරීම.

2. නොකඩවා සලාතය ඉටුකිරීම.

3. Zසකාත් ගෙවීම

4. රමලාන් මාසය තුළ උපවාස ශීලය රැකීම

5. අල්ලාහ්ගේ ශුද්ධ නිවසට ගොස් හජ් වන්දනාය ඉටු කිරීම

අල්ලාහ්ගේ ඒකියත්වය පිළිබඳ

අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"අල්ලාහ් හැර (අන්) දෙවියෙක් නැතැයි අල්ලාහ්ද මලාඉකාවරුද යුක්තිය මත අවලට පිහිටා සිටින්නාවූ දැනුමැත්තෝද සාක්ෂි දරති. ඔහු හැර අන්දෙවියෙක් නැත. ඔහු මහා බලසම්පන්නය නුවණැතිය"*

සූරාව : අල් ඉම්රාන් - 3 : 18

මෙයින් අදහස් කරනුයේ නැමදුම් හිමිවිය යුත්තේ අල්ලාහ්ට පමණක් බවත් අල්ලාහ් හැර අන් කිසි දෙවි දේවතාවෙකුට නැමදුම් නොකළ යුතු බවත්ය. අල්ලාහ්ට සමානයෙක් නොමැති බැවින් නැමදුමෙහි අල්ලාහ්ට සමානයෙක් නොතැබිය යුතු ය.

අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"ඉබ්රාහිම් ඔහුගේ පියාටද ඔහුගේ ජනතාවටද "ඇත්තෙන්ම ඔබ නැමදුම් කරන දැය මම ප්‍රතික්ෂේප කරමි" යි කී බව (සිහිකරව), මම නැමදුම් කරන්නේ මා මැවූ ඔහුට පමණි. ඔහු මට යහමග පෙන්වන්නේය. ඔහු (ඉබ්රාහිම්) මෙය ඔහුගෙන්*

*පැවතෙන පරම්පරාවෙහි ඔවුන් ඔහු වෙත හැරෙනු පිණිස පවතින නියෝගයක් කළේය”*

සූරාව : අZස් Zුkහ්රුෆ් - 43 : 26, 27, 28

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*“පුස්තකය හිමි අයවලුනි ! (යුදෙව්වන් හා කිතු බැතියන්) අප සහ ඔබලා අතර පොදු සම්මතයකට එළඹෙවු. අපි අල්ලාහ් හැර (අන් කෙනෙකු) නොඅදහන්නෙමුයි ද ඔහු සමඟ සමානයන් නොතබන්නෙමුයිද අප අතරින් දෙවි දෙවි දේවතාවුන් තෝරා අල්ලාහ් සමඟ සමානයන් බවට පලකා ඔවුන්ට නැමදුම් නොකරන බවද කියව. ඔවුහු ප්‍රතික්ෂේප කළහොත් “සවත් පිරිසෙයින් අපි අල්ලාහ් නමදින මුස්ලිම්වරැයයි සාක්ෂි දරනු”යි කියව”*

සූරාව : අල් ඉම්රාන් - 3 : 64

<u>මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* අල්ලාහ්ගේ දූතයා බවට අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*“ඔබලා අතරෙන්ම රසූල්වරයෙකු ඔබලා වෙත පැමිණ ඇත. ඔබලා පරිහානියට පත්වීම ගැන ඔහු කනස්සල්ලට පත්වෙයි.*

*ඔබලා ගැන ඔහුට මහත් කැක්කුමක් ඇත. විශ්වාස කරන්නවුන් කෙරෙහි ඔහු දයාව සහ අනුකම්පාව දක්වයි”*

සූරාව : අත් තව්බා - 9 : 128

මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* තුමාණෝ අල්ලාහ්ගේ දූතයා යයි ප්‍රකාශ කිරීමෙන් අදහස් වන්නේ අප එතුමාගේ විධානයන්ට කීකරු විය යුතු බවත්, එතුමා පවසා ඇති දේ විශ්වා සකළ යුතු බවත්,එතුමා තහනම් කළ දැයින් වැලකිය යුතු බවත් අල්ලාහ්ට නැමදුම් කළ යුතු බවත්ය.

**නැමදුම්, Zසකාත් හා අල්ලාහ්ගේ ඒකීයත්වයේ අර්තය පිළිබඳව අල් කුර්ආනයෙන් සාධක :-**

*“අවංක භක්තියෙන් යුක්තව සත්‍යයෙහි පිහිටා අල්ලාහ් නැමදීමටද සලාත්හි නිරතවීමටද Zසකාත් දීමටද ඔවුන්ට අන කරනු ලැබ ඇත. සත්‍යවූ ඍජු මාර්ග වයයි”*

සූරාව : අල් බය්යිනා - 98 : 5

## උපවාස ශීලය පිළිබඳව

## අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"එම්බල විශ්වාස කරන අයවලුනි ! ඔබ භක්තිවන්තයන් කිරීම සඳහා ඔබට පෙර වූ අය කෙරෙහි අනිවාර්ය කළාක් මෙන් ඔබ කෙරෙහිද උපවාසය අනිවාර්ය කරන ලදී"*

සූරාව : අල් බකරා - 2 : 183

## හජ් වන්දනය පිළිබඳව

## අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"අල්ලාහ් උදෙසා "හජ්" කිරීම එහි යෑමට හැකි අර්ථික ශක්තියක් ඇති අය කෙරෙහි අනිවාර්ය කර ඇත. යමෙක් දැනම ප්‍රතික්ෂේප කළහොත් ඇත්තෙන්ම, අල්ලාහ් ලෝක වාසීන්ගෙන් ස්වයංපූර්ණය"*

සූරාව : අල් ඉම්රාන් - 3 : 97

## දෙවන ස්ථරය

## ඊමාන් (විශ්වාසය)

ඊමානය හැත්තෑවකට අධිකවූ අනු අංගයන්ගෙන් සමන්විතය. එහි ප්‍රධාන අංගය අල්ලාහ් හැර අන් දෙවි කෙනෙක් නැතිබවට සාක්ෂි දැරීමයි. සුළුම අංගය නම් ගමන් මාර්ගයක ඇති යම් බාධකයක් ඉවත් කිරීමයි. සංවරශීලිභාවයද ඊමාන්හි එක් අංගයකි. ඊමානයේ කුළුණු හයකි. ඒවා නම් පහත සදහන් දැ විශ්වාස කිරීමයි.

### ඊමානයේ කුළුණු හය

1. අල්ලාහ් ගැන විශ්වාස කිරීම.

2. අල්ලාහ්ගේ මලාඉකාවරුන් ගැන විශ්වාස කිරීම.

3. අල්ලාහ්ගේ පුස්තකයන් ගැන විශ්වාස කිරීම.

4. අල්ලාහ්ගේ රසූල්වරුන් ගැන විශ්වාස කිරීම.

5. අවසාන දිනය ගැන විශ්වාස කිරීම.

6. අල්ලාහ්ගේ පෙරමිනුම් අනුව යහපත්වූත් අයහපත්වූත් සියල්ල සිදුවන්නේ යයි විශ්වාස කිරීම.

<u>ඊමානයේ කුළුණු හය පිළිබඳව</u>

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"ඔබලාගේ මුහුණු නැගෙනහිර දෙසට හෝ බස්නාහිර දෙසට හෝ හැරවීම යහකමක් නොවේ. එහෙත්, යහකම නම් අල්ලාහ් ගැනද, අන්තිම දින ගැනද, මලාඉකාවරුන් ගැනද, පුස්තක ගැනද, නබිවරයන් ගැනද විශ්වාස කර ඔබලාගේ දේපොලවලින් ඥාතීන්ටද, අනාථයන්ටද, දුගියන්ටද, මගියන්ටද, යදින්නන්ටද, වහලුන් නිදහස් කිරීමටද දී සලාත්හි නිරතවද, Zකාත් දීද, ගිවිසුම් ඉටුකරද, ලෙඩදුක්, දිළිඳුකම, යුද බිය ඉවසා සිටීමය. ඔවුහුමය සත්‍යවන්තයෝ ඔවුහුමය අල්ලාහ් කෙරෙහි බිය බැතියෙන් සිටින්නෝ"*

සූරාව : අල් බකරා - 2 : 177

<u>සියල්ලක්ම අල්ලාහ්ගේ පෙර මිනුම් අනුව</u>

<u>සිදුවන බවට අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"ඇත්තෙන්ම, අපි සියළු දෙය සමානුපාතිකව මවා ඇත්තෙමු"*

සූරාව : අල් කමර් - 54 : 49

## තුන්වන ස්ථරය

## ඉහ්සාන් (නැමදුමේ පරිපූර්ණත්වය)

ඉහ්සාන් තනි කුළුණකින් යුක්තය. එනම් අල්ලාහ් ඔබට පෙනෙන්නාසේ ඔබ අල්ලාහ් නැමදිය යුතුය. ඒ මන්ද යත් ඔබට අල්ලාහ් නොපෙනුනද අල්ලාහ්ට ඔබ පෙනෙන නිසාය.

### අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"ඇත්තෙන්ම, අල්ලාහ් බිය බැතියන් හා යහකම් කරනවුන් හා සමඟය"*

සූරාව : අන් නහල් - 16 : 128

*"ඔබ නැමදුම සඳහා නැගිට සිටින විට ඔබ දකින තැනැත්තාද සුජූද් කරන්නවුන් අතර ඔබේ ඉරියව් දකින තැනැත්තාද වූ මහා බලපරාක්‍රමාන්විත දයාවන්තයා කෙරෙහි විශ්වාසය තබව. සියල්ලක්ම ඔහුට ඇසෙන්නේය. ඔහු සියල්ලක්ම දන්නේය.*

සූරාව :අෂ්ශු:රා - 26 : 217-220

*"ඔබ කවර කාර්යයක නිරතව සිටියද, අල් කුර්ආනයෙන් කවර කොටසක් පාරායනය කරමින් සිටියද, ඔබ (මිනිස්වර්ගයා) කුමන කටයුත්තක යෙදී සිටියද ඒ සියල්ලක්ම අපේ නිරීක්ෂණයට බඳුන් වන්නේය"*

සූරාව : යූනුස් - 10 : 61

<u>හදීසයෙන් සාක්ෂි :-</u>

ජිබ්රීල් සම්බන්ධ සුප්‍රසිද්ධ හදීසයයි.

උමර් අල් කත්තාබ් මෙසේ වාර්තා කරයි :-

දිනක් අපි මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* තුමාණන් සමඟ සිටින විට සුදෝ සුදු වස්ත්‍රයෙන් සැරසුන තද කළු පැහැති හිස්කෙස් සහිත පුද්ගලයෙක් අප වෙත පැමිණියේය. ගමන් වෙහෙසේ ලේශයක්ද ඔහුගෙන් දකින්නට නොතිබුනි. අප අතරෙන් කිසිවෙකුට ඔහු හඳුනාගත නොහැකි විය. නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* තුමාණන්ගේ දණහිසේ සිය දණහිස වදිනසේ වාඩිවී එතුමාගේ කලවා මත සිය අත තබා ඔහු "මුහම්මද් ! මට ඉස්ලාම් ගැන කියාදෙන්නැ"යි කීවේය. එවිට එතුමා "ඉස්ලාම් කියන්නේ අල්ලාහ් හැර අන් කිසි දෙවි කෙනෙක් නැත. මුහම්මද්

අල්ලාහ්ගේ දූතයා යයි සාක්ෂි දැරීම, නැමදුම ඉටු කිරීම, Zසකාත් ගෙවීම, රමලාන් මාසය තුල උපවාස ශීලය රැකීම, වත්කම් ඇත්නම් හජ් වන්දනය ඉටු කිරීම" යයි පැවසූහ. එවිට එම අමුත්තා "ඔබ සත්‍යය ප්‍රකාශ කළෙහිය" යි කීවේය. මෙම පුද්ගලයා එතුමාගෙන් ප්‍රශ්න ඇසීමත් එයට පිළිතුරු දුන්විට "ඔබ සත්‍යය ප්‍රකාශ කළේය" යි ප්‍රකාශ කිරීමත් පිළිබඳව අපි පුදුමයට පත්වුනෙමු. ඊළඟට ඔහු "මට දැන් ඊමානය (විශ්වාසය) ගැන කියන්න" යි ඉල්ලා සිටියේය. එවිට එතුමා "අල්ලාහ් ගැනද, ඔහුගේ මලාඉකාවරු ගැනද, ඔහුගේ පුස්තකයන් ගැනද, ඔහුගේ නබිවරුන් ගැනද, අවසාන දිනය ගැනද, සෑම යහපත් හා අයහපත් දෙයක්ම අල්ලාහ්ගේ පූර්ව සැලැස්ම අනුව සිදුවන බවටද විශ්වාස කිරීමයි" යනුවෙන් ප්‍රකාශ කළහ. එවිටද අමුත්තා නබි තුමා සත්‍ය ප්‍රකාශ කළ බව සඳහන් කරමින් ඔහු "යහකම් කිරීම ගැන මට කියන්නැ" යි ඉල්ලා සිටියේය. එවිට එතුමා "අල්ලාහ් ඔබට පෙනෙන්නාක්සේ ඔබ අල්ලාහ් නැමදිය යුතුය. ඒ මන්ද යත් ඔබට අල්ලාහ් නොපෙනුනද අල්ලාහ්ට ඔබ පෙනෙන නිසාය (ඉහ්සාන්)" යයි පිළිතුරු දුන්හ. එවිට අමුත්තා "මට අවසාන "පැය" ගැන කියන්න" යි ඉල්ලා සිටියේය. එයට පිළිතුරු වශයෙන් එතුමා "එම ප්‍රශ්නය අසන තැනැත්තාට වඩා වැඩිමනක් දෙයක් අසනු ලැබ ඇති පුද්ගලයාද නොදන්නේය" යි පිළිතුරු දුන්හ. එවිට ඔහු "එසේ නම් මට එහි ලකුණු ගැන කියන්නැ"යි ඉල්ල සිටියේය. එයට පිළිතුරු වශයෙන් එතුමා "මෙහෙකාරියෙකු

තමාගේම ස්වාමිදූට ප්‍රසූත කරනු ඇත. පාවහන් නොපැළඳූ, නිරුවත් දුගී මිනිසුන් සහ එඬේරන් මහා මන්දිරවල වැජඹෙනු දකින්නට ලැබෙනු ඇත" යයි පිලිතුරු දුන්හ. උමර් (රලි) තුමා තවදුරටත් මෙසේ පැවසුවේය. අනතුරුව එම අමුත්තා පිටත්ව ගියේය. මම දීර්ඝ වේලාවක් එතැන සිටියායින් පසුව නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා මාඅමතා "උමර්, මගෙන්* ප්‍රශ්න ඇසූ පුද්ගලයා කවරෙක්දැයි ඔබ දන්නේදැ" යි මගෙන් විමසූහ. "එය හොදින් දන්නේ අල්ලාහ්ගේ දූතයා නොවේදැ" යි මම පිලිතුරු දුනිමි. එවිට එතුමා "මෙහි පැමිණ සිටියේ ඔබලාට ඔබලාගේ ආගම ඉගැන්වීම සඳහා මලාඉකා ජිබ්රීල්" යයි පැවසූහ.

(සහී මුස්ලිම් ඇසුරෙන්)

## තුන්වන මූලධර්මය

## මුහම්මද් නම් *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* පිළිබඳ දැනුම

ඔහු ඉබ්රාහිම් අල් කලිල්ගේ පුතු ඉස්මාඊල්ගෙන් පැවත එන්නාවූ අරාබියානු ගෝත්‍රයක් වන කුරෙයිෂ් ගෝත්‍රයේ හාෂිම්ගේ පුත්‍රයාවූ අබ්දුල් මුත්තලිබ්ගේද පුත්‍රයාවූ අබ්දුල්ලාගේ පුතු මුහම්මද්ය.

ඔහු මක්කාවෙහි උපත ලැබුවේය. ඔහු අවුරුදු හැටතුනක් ජීවත්ව සිටියේය. එයින් අවුරුදු හතළිහක් ගෙවී ගියේ අල්ලාහ්ගේ දූත මෙහෙවරෙහි යෙදීමට පෙරාතුවය. නබිවරයෙක් සහ අල්ලාහ්ගේ දූතයෙකු වශයෙන් අවුරුදු විසිතුනක් ජීවත්වූහ.

ඔහුට නබිත්වය පවරනු ලැබුවේ අල් කුර්ආනයේ පහත සඳහන් පාඨය පහළ කිරීමත් සමඟය :-

*"මැවුම්කරුවාණන් වූ ඔබ හිමිගේ නාමයෙන් කියවව. ඔහු මිනිසා සත ලේ කැටියකින් මැව්වේය. කියවව, ඔබගේ හිමි අති උදාරය. ලිවීමට උගැන්නුවාවූ ඔහු නොදන්නා දැය මිනිසාට ඉගැන්නුවේය"*

සූරාව : අල් අලක් - 96 : 1-5

පසුව අල්ලාහ්තආලා බහුදේවවාදීන්ට අවවාද කිරීමටත් තව්හීදය (අල්ලාහ්ගේ ඒකීයත්වය) ප්‍රචලිත කිරීමටත් දූතයෙක් වශයෙන් ඔහු එව්වේය.

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"එම්බා (ලෝගුවෙන්) වසාගත් පුද්ගලය ! නැගිට අනුශාසනා කරව. ඔබ හිමි අති ශ්‍රේෂ්ඨයයි උත්කෘෂ්ටවත් කරව. ඔබගේ වස්ත්‍ර පිරිසිදුව තබා ගනුව. පිළිකුල් සහගත දැයින් ඈත්වව. ලාභයක් බලාපොරොත්තුවෙන් යමක් නොදෙව. ඔබ හිමිගේ මෙහෙවරෙහි අවලුව ඉවසිලිවන්තව කටයුතු කරව"*

සූරාව : අල් මුද්දස්සිර් - 74 : 1 - 7

නැගිට අනුශාසනා කරව යනුවෙන් අදහස් කරනුයේ ඒකදේවවාදය ප්‍රචලිත කිරීම සහ බහුදේවවාදයට එරෙහිව අවවාද කිරීමයි. ඔබ හිමි අති ශ්‍රේෂ්ඨයයි උත්කෘෂ්ටවත් කරව යනුවෙන් අදහස් කරනුයේ අල්ලාහ්ගේ ඒකත්වය පිළිබඳව ඇති කරගන්නාවූ බැදීමයි. ඔබගේ වස්ත්‍ර පිරිසිදුව තබා ගනුව යනුවෙන් අදහස් කරනුයේ ඔබගේ ක්‍රියාවන් තුළින් බහුදේවවාදයේ කිලිටෙන් ආරක්ෂා කර ගැනීමයි. පිළිකුල් සහගත දෙයින් ඈත්වව යනුවෙන් අදහස් කරනුයේ පිළිම හා පිළිම වන්දනාකරුවන්ගෙන් ඈත්වී ඔවුන් ප්‍රතික්ෂේප කිරීමයි.

එතුමාණෝ දිගටම දස වසරක කාලයක් අල්ලාහ්ගේ ඒකත්වය පිළිබඳව දේශනා කළහ. ඉන්පසු එතුමාණෝ ජිබ්රීල් (අලෛ) තුමා විසින් "මි:රාජ්" යාත්‍රයේ අල්ලාහ්තආලාගේ "අර්ෂ්" වෙත කැඳවාගෙන යන ලදුව එහිදී දිනකට පස්වතාවක් ඉටුකරන නැමදුම (සලාතය) සහ එහි වේලාවන් නියම කරන්නට යෙදුනි. අනතුරුව වසර තුනක කාලයක් එතුමාණෝ මක්කාවෙහි සලාතය ඉටු කළහ.

අනතුරුව එතුමාට මදීනාවට යන ලෙසට අල්ලාහ්තආලාගෙන් අණ ලැබුනි. හිජ්රා යනුවෙන් හැඳින්වෙන මෙම ගමනෙන් අදහස් වනුයේ බහුදේවවාදීන්ගෙන් ඈත්වී ඉස්ලාමීය ප්‍රජාව සමඟ පදිංචියට යාමයි. එමනිසා, බහුදේවවාදී ප්‍රජාව වෙත සිට ඉස්ලාමීය ප්‍රජාව වෙත යාම (හිජ්රාව) අවසාන දිනය තෙක් මුස්ලිම්වරුන් විසින් අනිවාර්යයෙන් ඉටු කළ යුතු යුතුකමක් වන්නේය.

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"තමන් විසින්ම තමන්ට හානි සිදු කරගෙන සිටින අයගේ ප්‍රාණය මලාඉකාවරුන් අත්පත් කරගන්නා කල්හි, "තොප කවර තත්ත්වයක සිටියහුද?"යි (මලාඉකාවරු) විමසති. එවිට ඔවුහු "අපි මෙලොවේ දුර්වලයන්ව, පීඩිතව සිටියෙමු"යි කියති. අල්ලාහ්ගේ අති විශාලවූ පොළෝ තලයෙහි පාපී ක්‍රියාවන්ගෙන්*

*ඇත්විමට තරම් තොපට ඉඩකඩ නොතිබුණේදැයි මලායිකාවරුන් විමසනු ලබති. එවන් අයගේ නිවහන වන්නේ නිරයයි, නපුරුය ඔවුන් යන තැන. පුරුෂයන්ගෙන්ද, ස්ත්‍රීන්ගෙන්ද, කුඩා දරුවන්ගෙන්ද කිසිම හවුහරනක් ලබාගැනීමට තරම් සවියක් නොමැති ඇත්තවශයෙන්ම දුර්වලව සිටිමිනිසා (එයින් බැහැර යාමට) මග නොදැන සිටියවුන් හැරය. මොවුනට අල්ලාහ්ගේ සමාව අපේක්ෂා කළ හැක. අල්ලාහ් පාපයන් මකා දමා නැවත නැවතත් සමා කරන්නේය”*

සූරාව : අන්නිසා - 4 : 97 - 99

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*“විශ්වාස කරන්නාවූ මගේ දාසයිනි ! ඇත්තෙන්ම මගේ පෘථිවිය විස්තීර්ණය. එහෙයින් මා නමදිවු”*

සූරාව : අල් අන්කබූත් 29 : 56

අල් බගවී පවසන අන්දමට ඉහත සඳහන් පාඨයන් කියවුණේ බදර් යුද්ධය පැවති කාලයේදී මදීනාවට සංක්‍රමණය නොවී මක්කාවෙහි රැඳී සිටි මුස්ලිම්වරුන්වය. අල්ලාහ් විශ්වාස කරන අය වශයෙන් ඔවුන් හඳුන්වනු ලබති.

## හදීසයෙන් සාක්ෂි :-

පශ්චාත්තාපවීම අවසන් වන තෙක් පීඩනයට පත් මුස්ලිම්වරුන් රැකවරණය සඳහා සංක්‍රමණය වීම අවසන් නොවේ. බස්නාහිරින් හිරු පායන තෙක් පශ්චාත්තාපවීම අවසන් නොවේ.

මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්* තුමාණෝ මදීනාවෙහි පදිංචිවීමෙන් අනතුරුව සෙසු විධානයන් පනවනු ලැබිය. Zසකාත්, උපවාස ශීලය, හජ් වන්දනය, අල් අZසාන් (සලාතය සඳහා කරන ඇරයුම), ජිහාද් (අල්ලාහ්ගේ මාර්ගයේ සටන් වැදීම) සහ යහපත් ක්‍රියා කරන ලෙසට වූ නිර්දේශය සහ අයහපත් ක්‍රියා හෙළාදැකීම පිළිබඳ විධානද මීට ඇතුලත් වේ. අවුරුදු දහයකට පසු අභාවප්‍රාප්ත වන තෙක්ම එතුමාණෝ මදීනවෙහි ජීවත් වූහ. එහෙත් යහපත් ක්‍රියාවන් සඳහා මුස්ලිම්වරුන් මෙහෙයවීමටද අයහපත් ක්‍රියාවලට එරෙහිව ඔවුනට අනතුරු ඇහවීමටද ඔහුගේ ආගම ඉතිරිවී ඇත. යහපත් ක්‍රියා යනුවෙන් අදහස් කරනුයේ ඒකදේවවාදය පිළිපැදීම සහ අල්ලාහ් ප්‍රිය කරන්නාවූ සහ

ප්‍රසාදයට පත්වන්නාවූ ක්‍රියාවන්හි නිරතවීමය. අයහපත් ක්‍රියාවන් යනුවෙන් අදහස් කරන්නේ බහුදේවවාදය සහ අල්ලාහ් අකැමැත්තක් දක්වන්නාවූ සහ ඔහු විසින් තහනම් කරනු ලැබ ඇති ක්‍රියාවන් වේ.

සෑම ජන කොට්ඨාශයක් සහ සෑම දේශයක් වෙත මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම්* තුමා අල්ලාහ් විසින් එවා ඇත. මුළු මහත් මිනිස් වර්ගයා සහ ජින්වරුන් එතුමාණන් අනුගමනය කරමින් එතුමා දෙන පණිවුඩය පිලිපැදිය යුතු බවට අල්ලාහ් විධාන කොට ඇත.

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

> *“ජනතාවෙනි ! අල්ලාහ්ගේ රසූල්වරයා වශයෙන් ඔබ සියලු දෙනා වෙත මා එවා ඇත්තේයයි කියව”*

සූරාව : අල් අ:රාෆ් - 7 : 158

අල්ලාහ්තආලා සිය ආගම මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම්* සමගින් පරිසමාප්තයට පත් කළහ.

අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"අද දින ඔබ වෙනුවෙන් ඔබේ ආගම මම සම්පූර්ණ කළෙමි"*

සූරාව : අල් මාඉදා - 5 : 3

මුහම්මද් තුමාගේ අවසානය පිළිබඳව

අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"ඇත්තෙන්ම, ඔබ මැරෙන්නෙහිය. ඔවුන්ද මැරෙන්නෝය. පසුව පුනුරුත්ථාන දින ඔබ සියලු දෙනා ඔබ හිමි අබියසදී ඔබලාගේ ආරවුල් විසදා ගන්නහුය"*

සූරාව : අZසු Zසුමර් - 39 : 30 , 31

මිනිසුන් මයයැමෙන් පසුව නැවත පන ගන්වා නැගිට්ටවනු ලබන්නේය

අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"එයින්ය (පස් වලින්) මා විසින් තොප මවනු ලැබුවේ පසටමය අපි ඔබ යලි යවන්නේ. එයින්ය ඔබ නැවත බිහි කරවන්නේ"*

සූරාව : අල් තාහා - 20 : 55

*"අල්ලාහ් ඔබ පොළොවෙන් (කෙමෙන්) වැවෙන පැලයක් සේ බිහි කළේය. අවසානයෙහි ඔහු ඔබ ආපසු පොළොවටම ආපසු යවා නැවත පණගන්වා නැගිටුවන්නේය"*

සූරාව : අන් නූහ් - 71 : 17 , 18

නැවත පණගන්වා නැගිට්ටවනු ලැබීමෙන් පසුව ඔවුන් තමන්ගේ කළ ක්‍රියාවන් පිළිබඳව අල්ලාහ්ට වගකිවයුතු වන්නේය. ඒ අනුව ඔවුනට යහ ප්‍රතිඵල හෝ දඬුවම හිමි වන්නේයට.

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"අහසේ දෙයද පොළොවේ දෙයද අයත්වන්නේ අල්ලාහ්ටය. පාපයන් කළවුන්ට ඔවුන් කළ දෙයට දඬුවම් දෙන්නේය. යහකම් කළවුන්ට යහඵල දෙන්නේය"*

සූරාව : අන් නජ්ම් - 53 : 31

නැවත පණගන්වා නැගිට්ටුවන බව පිලි නොගන්නා යමෙක්වේද හෙතෙම විශ්වාස නොකරන්නෙකු වන්නේය.

<u>අල් කුර්ආනයෙන් සාධක :-</u>

*"විශ්වය සදහා තමන් නැවත පණගන්වා නැගිට්වනු නොලබන්නේයැයි විශ්වාස නොකරන්නවුන් සිතති. ඔබ කියන වශයෙන්ම නැවත පණගන්වා අනතුරුව ඔබ කළ කී දෑ සියල්ල පිළිබඳ සත්‍යය ඔබ වෙත දැනුම් දෙනු ලබන්නහුමය. එය අල්ලාහ්ට පහසු කටයුත්තක් යයි කියව"*

සූරාව : අල් තගාබුන් - 64 : 7

ප්‍රජාව වෙත ශුභාරංචි දීම සඳහා මෙන්ම අනතුරු ඇඟවීම සඳහාත් අල්ලාහ් ලොවට සිය දූතයන් එවා ඇත්තේය.

<u>අල් කුර්ආනයෙන් සාධක :-</u>

*"ඇතැම් අනාගත වක්තෘන් ගැන විස්තර ඔබ වෙත පවසා ඇත්තෙමු. තවත් සමහරෙක් ගැන විස්තර කියා නැත්තෙමු. අල්ලාහ් මූසා අලෛහිස්සලාම්* (මෝසස්) සමඟ කෙලින්ම කතා *කළේය. ශුභාරංචි පළ කරන්නද, අවවාද කරන්නද මිනිස් වර්ගයා වෙත අනාගත වක්තෘන් අප පහළ කළ බැවින් අල්ලාහ්ට විරුද්ධව දොස් පැවරීමට ජනතාවට ඉඩක් නැත. ඇත්තෙන්ම, අල්ලාහ් බලපරාක්‍රමයෙන් යුක්තය, අති මහා ප්‍රාඥයෝය"*

සූරාව : අන්නිසා - 4 : 164 , 165

පළමුවන අනාගත වක්තෘන්වූයේ නූහ්ය. අවසාන අනාගත වක්තෘන් වූයේ මුහම්මද් නබි *සල්ලල්ලාහු අලෛහිවසල්ලම්ය.* එතුමාණෝ නබිවරයන්ගේ මුද්‍රාව වන්නේය. (එතුමන්ලාට අල්ලාහ්ගේ ශාන්තිය හා ආශිර්වාදය හිමිවේවා)

නූහ් *අලෛහිස්සලාම්* අල්ලාහ්ගේ පළමුවන දූතයාය.

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"නූහ් වෙතද, ඔහුට පසු පැවත් නබිවරුන් වෙතද, "වහී" පහළ කළාක්මෙන් ඔබ වෙතද, අපි වහී පහළ කළෙමු"*

සූරාව : අන්නිසා - 4 : 163

අල්ලාහ් පමණක් නමදින ලෙසටත් ප්‍රතිමා වන්දනාව අත්හරින ලෙසටත් අණ කිරීම සඳහා අල්ලාහ්තආලා විසින් නූහ්ගේ සිට මුහම්මද් (එතුමාණන්ලාට අල්ලාහ්ගේ ශාන්තිය හා ආශිර්වාදය හිමිවේවා) දක්වා සැම දේශයකටම දූතයන් එවා ඇත.

අල් කුර්ආනයෙන් සාක්ෂි :-

*"අල්ලාහ් නමදිනු පාපයන් පිටු දකිනුයි ප්‍රකාශ කරමින් අපි එක් එක් ජන කොටසකට රසූල්වරයෙකු වශයෙන් එව්වෙමු"*

සූරාව : අන් නහල් 16 : 36

පිළිම ප්‍රතික්ෂේප කරන ලෙසටත් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබන ලෙසටත් මුළු මහත් මිනිස් වර්ගයාටම අල්ලාහ් අණ කර ඇත.

ඉබ්නුල්කයිම් (එතුමාට අල්ලාහ්ගේ කරුණාව හිමිවේවා___ තුමා මෙසේ පවසා ඇත :-

"විශ්වාස කරන්නෙකු සිය සීමාවන් ඉක්මවමින් යම් දෙයකට වැදුම් පිදුම් කරයිද නැතහොත්, ශිර්ෂ ප්‍රණාමය කරයිද නැතහොත් යටත් පහත් වෙයිද එම දෙය පිළිමයක් (තාගූත්) වන්නේය."

පිළිමයන් විවධය, බොහෝය. ඒවා ශීර්ෂයන් පහක් යටතේ වර්ග කළ හැක.
ඒවා නම් :-

1 ෂෙයිතාන් (සාතන්) - ඔහු අල්ලාහ්ගේ උදහසට බදුන්වේවා.

2 තමන් වෙත වැඳුම් පිදුම් කරන ලදුව අකමැත්තක් නොදක්වා එය භාරගන්නාවූ පුද්ගලයා

3 තමන්ට වැඳුම් පිදුම් කරන ලෙස ජනතාවට දන්වා සිටින පුද්ගලයා

4 නොපෙනෙන දෑ පිළිබඳව තමාට දැනුමක් තිබෙන බව කියා පාන පුද්ගලයා

5 අල්ලාහ්තආලා විසින් පහළ කරනු නොලැබූ දැයක් පදනම් කරගෙන විනිශ්වයක් හෝ තීන්දුවක් කරන පුද්ගලයා

<u>අල් කුර්ආනයෙන් සාක්ෂි :-</u>

*"ඉස්ලාමීහි බලකිරීමක් නැත. ඇත්තෙන්ම දුර්මාර්ගයෙන් සත්මාර්ගය පැහැදිලිය. යමෙක් තාගූත් (අල්ලාහ් හැර අන්දෙයක් නැමදීම) ප්‍රතික්ෂේප කොට අල්ලාහ් ගැන විශ්වාස කෙරේද, ඇත්තෙන්ම, ඔහු විශ්වාසය නොසිදෙන ලෙස තදින් ග්‍රහණය කර ගත්තාහු වෙති. අල්ලාහ්ට සියල්ලක් ඇසෙන්නේය* සියල්ලක් දන්නේය"

සූරාව : අල් බකරා - 2 : 256

අල්ලාහ් හැර අන් දෙවි කෙනෙක් නොමැත යන්නෙහි අර්ථය මෙය වේ.

<u>අල් හදීසයෙන් සාක්ෂි :-</u>

ආඥාවේ හිස ඉස්ලාමයයි. එහි මුදුන් කුළුණ නැමදුමයි. එහි උච්චස්ථානය ජිහාදයයි (අල්ලාහ්ගේ මෙහෙවරෙහි නියැලීම)

ඵධාත්ම දන්නේ අල්ලාහ්ය

السنهالية

إدارة أوقاف صالح عبدالعزيز الراجحي

# الأصول الثلاثة

(باللغة السنهالية)

محمد بن سليمان التميمي

طبع على نفقة إدارة أوقاف
صالح بن عبدالعزيز الراجحي
غفر الله له ولوالديه ولذريته ولجميع المسلمين